සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 12 - 2023

## බෞද්ධ ශිෂ්ටාචාරය - I

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

උපදෙස්

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට ඉතාමත් නිවැරදි පිළිතුරු තෝරා ගෙන උත්තර පත්‍රයේ නිවැරදි වරණය මත කතිර ලකුණ යොදන්න.

---

1. භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම අතර බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශූද්‍ර යනුවෙන් දැක්වෙනුයේ,

(1) ස්ව ධර්මයි. (2) ආශ්‍රම ධර්මයි. (3) ආපද් ධර්මයි. (4) වර්ණ ධර්මයි.
(5) බ්‍රාහ්මණ ධර්මයි.

2. ndyuKhk úik nyu iyjH;dj උදාකරදීමේ අපේක්ෂාවෙන් විවිධ ආගමික ක්‍රියාකාරකම්වල නියැලුණහ. ඔවුහු දෙවියන් සතුටුකරලීමේ අභිලාෂයෙන් සිදුකළ ප්‍රධානතම ආගමික මෙහෙය වූයේ,

(1) දේවාල ඉදිකරදීම ය. (2) වේද ග්‍රන්ථ රචනා කිරීම ය. (3) යාග කර්ම කිරීම ය.
(4) ආශ්‍රම ධර්ම ක්‍රියාත්මක කිරීම ය. (5) පූජක දිවියක් ගත කිරීම ය

3. ද්විජ ගණයට ඇතුළත් වර්ණවල දරුවන් දෙවන උපත ලබන්නේ ........................ මගිනි.

(1) යාග කර්මය (2) උපනයන කර්මය (3) ශ්‍රාද්ධ පූජාව
(4) වේදය ඉගැන්වීම (5) ආශ්‍රම ධර්ම

4. "විටෙක ආර්යයා දාසයෙක් ද තවත් වරෙක දාසයා ආර්යයෙක් ද විය හැකි ය. පාලකයා පරදවා වෙනත් අයෙකු රජ වූ විට පාලකයා පාලිතයා බවට පත්වේ. යනාදී වශයෙන් අස්සලායන සූත්‍රයේ සඳහන් මෙම දේශනාව තුළින් බුදුරජාණන් වහන්සේ ප්‍රකට කිරීමට උත්සහ කළේ, "

(1) වර්ණ භේදයෙහි පවත්නා නිස්සාරත්වයයි. (2) යාගයෙහි පවත්නා නිස්සාරත්වයයි.
(3) ආශ්‍රම ධර්මවල පවත්නා නිස්සාරත්වයයි. (4) වේදයෙහි පවත්නා නිස්සාරත්වයයි.
(5) ආපද් ධර්මවල පවත්නා නිස්සාරත්වයයි.

5. පහත සඳහන් ප්‍රකාශයන් අවධානයෙන් කියවන්න

**A** බ්‍රහ්ම සහව්‍යතාව සඳහා ඇති එක ම මාර්ගය යාගය බව බ්‍රාහ්මණ ඉගැන්වීම වේ.
**B** ඍග්, යජුර්, සාම යන වේදත්‍රයෙහි ම යාගය ගැන සඳහන් වේ.
**C** යාගයක් අංග සම්පූර්ණවීම සඳහා පූජක බ්‍රාහ්මණයින් තිදෙනෙක් අත්‍යවශ්‍ය වේ.
**D** යාගයෙහි වරප්‍රසාද සෑම ජනකොටසකට ම ලබා ගත හැකි ය.
**E** යාග ක්‍රම ගණනාවක් බමුණන් විසින් ක්‍රියාත්මක කරන ලදී.

ඉහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1) A, සහ B පමණි. (2) A, C සහ E පමණි. (3) A, B සහ E පමණි
(4) A, B, C, සහ D පමණි. (5) A, B,C, D සහ E යන සියල්ලෙහි ම ය.

6' "ස්ත්‍රිය බාල වියේ දී දෙමාපියන් යටතේ ද, තරුණ වියේ දී ස්වාමිපුරුෂයා යටතේ ද, මහලු වියේ දී වැඩිමහල් පිරිමි දරුවා යටතේ ද ජීවත් විය යුතු යැයි" මනුස්මෘතියේ දැක්වෙන මෙම ප්‍රකාශයෙන් ප්‍රකට කරනුයේ,

(1). ඇගේ ආගමික නිදහස සීමා කෙරුනු බවයි.
(2). ඇගේ ආර්ථික නිදහස සීමා කෙරුනු බවයි.
(3) ඇගේ දේශපාලනික නිදහස සීමා කෙරුනු බවයි.
(4). ඇගේ සාමාජික නිදහස සීමා කෙරුනු බවයි.
(5). ඇගේ ආධ්‍යාත්මික නිදහස සීමා කෙරුනු බවයි.

7. පැවිදි ගිහි සමාජ දෙකෙහි ම කාන්තාවන්ට නිසිතැන දීම අනුමත කරන බුදුදහම මාතෘත්වය ගෞරවනීයත්වයට පත් කළ බව ප්‍රකට වන හොඳ ම නිදසුන වන්නේ

(1) කාන්තාවන්ට බුදු සසුනේ පැවිදිවීමට අවසරදීම ය.
(2) සිය දරුවා මිය යාම නිසා බලවත 'සේ දුකට පත්වී සිටි කිසාගෝතමියට පිහිටවීම ය.
(3) මව බ්‍රහ්ම ලෙස හැඳින්වීම ය
(4) ප්‍රජාපතීගෝතමියට අෂ්ට ගරු ධර්ම පැනවීම ය.
(5) රාහුල මාතාවට භික්ෂුණී පැවිද්ද ලබා දීම ය.

8. සිය බිරිඳ සම්මානයට ලක්කිරීම, අවමන් නො කිරීම, වෙනත් ස්ත්‍රීන් නො පැතීම,නිවසේ ආධිපත්‍යය පැවරීම, වස්ත්‍රාභරණ සැපයීම යනුවෙන් සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන යුතුකම් ඉටු කිරීම තුළින් ප්‍රකට වනුයේ

(1) බිරිඳත් ස්වාමියාත් අතර සමානාත්මතාවක් ඇතිකිරීමයි.
(2) මවක් වශයෙන් කාන්තාව පූජනීයත්වයට පත්කොට ඇතිබවයි.
(3) පවුල් ඒකකය තුළ බිරිඳට ගෞරණීය තත්වයක් ලබා දී ඇතිබවයි.
(4) බිරිඳ බාහිර සමාජය තුළ සම්මානයට ලක්කර ඇතිබවයි.
(5) පවුලක් තුළ බිරිඳ ස්වාමියාට වඩා උතුම්බවයි.

9. බුද්ධ කාලයේ ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කළ -------------- නම් වූ ශ්‍රමණ ගුරුකුලය සමාජයට ඉදිරිපත් කරනු ලැබුවේ ආත්මවාදයයි.

(1) ආජීවක (2) නිගණ්ඨ (3) තාපස . (4) පරිබ්‍රාජක (5) ජටිල

10. පහත සඳහන් ප්‍රකාශයන් අවධානයෙන් කියවන්න.

**A** පුද්ගල ස්වාමිත්වය අගය කළ පිරිසක් වීම
**B** පිණ්ඩපාතයෙන් යැපෙන පිරිසක් වීම.
**C** අනගාරික ජීවිතයක් ගත කරන පිරිසක් වීම.
**D** අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධත්වයෙන් යුත් පිරිසක් වීම.
**E** අටලෝ දහමින් කම්පා නොවන පිරිසක් වීම

ඉහත ප්‍රකාශ අතරින් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායට පමණක් අනන්‍ය වූ ලක්ෂණ ඇතුළත් වන්නේ,

(1) A, B, C වල පමණි (2) A, B, E වල පමණි. (3) A, D, E වල පමණි.

(4) A, B, C, D වල පමණි. (5) A,B,C, D,E යන සියල්ලෙහි ය.

11. සත්වයාගේ කෙළෙසීම හෝ විසුද්ධිය පිණිස හේතුඵල සම්බන්ධතාවක් නැත. තමන්ගේ හෝ අනුන්ගේ යහපත පිණිස කළ යුතු දෙයක් නැත. සියලු සත්වයෝ වීර්යය, බලය, ආත්ම ශක්තිය රහිතයෝ ය. මෙයින් ඉගැන්වෙන ආගමික චින්තාව හඳුන්වන්නේ

(1) පරම අවිහිංසාව ලෙසයි. (2) පුබ්බේකතහේතුවාදය ලෙසයි.
(3) උච්ඡේදවාදය ලෙසයි. (4) අමරා වික්ඛේපවාදය ලෙසයි.
(5) අහේතු අප්‍රත්‍යයවාදය ලෙසයි.

12. ''පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනුවෙන් නොබිඳෙන ස්ථිර වූ සප්ත පදාර්ථයක් ඇත.'' යනුවෙන් ඉගැන්වූ බුද්ධකාලීන ශාස්තෘවරයා කවුරුන් ද?
(1) පූර්ණ කාශ්‍යප (2) මක්ඛලී ගෝසාල (3) අජිත කේසකම්බල (4) පකුධ කච්චායන
(5) නිගණ්ඨනාතපුත්ත

13. ගිජ්ජකූටය යනු බෞද්ධ සාහිත්‍යයේ දක්වෙන වැදගත් බෞද්ධ පූජනීය ස්ථානයකි. බුදුරජාණන් වහන්සේ ගිජ්ජකූට පර්වතයේදී සූත්‍ර ගණනාවක් දේශනාකොට ඇත. මෙම පර්වතය පිහිටා ඇත්තේ එවකට පැවැති
(1) වජ්ජි රාජ්‍ය තුළ ය . (2) අවන්ති රාජ්‍ය තුළ ය . (3) කෝසල රාජ්‍ය තුළ ය
(4) මල්ල රාජ්‍ය තුළ ය . (5) මගධ රාජ්‍ය තුළ ය .

14. බුද්ධකාලීන පාලකයින්, බුදුරජාණන් වහන්සේ සමඟ සමීප සබඳතා පැවැති බවට තොරතුරු සූත්‍රාගත ඉගැන්වීම් ඇසුරෙන් හඳුනාගත හැකි ය. කොසොල් රජතුමා ඒ අතර ප්‍රමුඛ වේ. ඒ බව. .......................... හොඳින් පැහැදිලි කෙරේ.
(1) තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කිරීම තුළින්
(2) කෝසල සංයුක්තයේ ඇතුළත් සූත්‍ර පිළිබඳ විමසීමෙන්
(3) වේළුවනාරාමය පූජාකිරීමෙන්
(4) කළගුණ සැලකීමේ අගය පැහැදිලි කිරීම තුළින්
(5) රාජ භටයන් පැවිදි නො කරන ලෙසට කළ ඉල්ලීමෙන්

15. බුද්ධකාලීන භාරතයේ ක්‍රියාත්මක වූ වෙළඳාම දේශීය වශයෙන් පමණක් නො ව විදේශීය වශයෙන් ද ප්‍රකට ව පැවැති බවට සාධක රැසක් හඳුනාගත හැකි ය. ඒ සඳහා දැක්විය හැකි කදිම සාක්ෂියක් වන්නේ
(1) බුද්ධකාලීන භාරතයේ භාණ්ඩ ප්‍රවාහනයට ගැල් බහුල ව භාවිත කිරීම.
(2) බුද්ධකාලීන භාරතය වාණිජකරණයට ලක් ව පැවැතීම
(3) වෙළඳ මාර්ග රැසක් පැවැතීම
(4) ඇතැම් නගර වෙළඳාමට ප්‍රසිද්ධ ව පැවැතීම
(5) සේද මාවත උපයෝගී කරගෙන සිදු වූ වෙළඳාම

16. කෘෂි කර්මාන්තයේ යෙදෙන ගොවියන්ට රාජ්‍ය අනුග්‍රහය ලබා දිය යුතුබව සඳහන් වන්නේ
(1) දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේ ය. (2) දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
(3) දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ ය. (4) සංයුක්ත නිකායේ කසීභාරද්වාජ සූත්‍රයේ ය.
(5) අංගුත්තර නිකායේ ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ය.

17. බුද්ධකාලීන භාරතයේ පැවැති සොළොස් මහා ජනපද පිළිබඳ ව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) වෛශාලිය අගනුවර කරගත් වජ්ජි රාජ්‍යයේ පාලන කටයුතු සඳහා 7770 දෙනා සම්බන්ධ විය.
(2) රජගහනුවර අගනගරය කරගත් මගධ රාජ්‍යයට ගම් 60000 ක් ඇතුළත් විය.
(3) සාවත්ථිය අග නගරය කරගත් කොසොල් රාජ්‍යයෙහි 19 වතාවක් බුදුරදුන් වස්වාසය කර ඇත.
(4) කුසිනාරාව අගනගරය කරගත් මල්ල රාජ්‍යය ගණතන්ත්‍ර රාජ්‍යයකි. .
(5) උදේනිය අගනගරය කරගත් අවන්තියේ බුද්ධකාලීන පාලකයා පරන්තප ය.

18 අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයන්හි පවත්නා පදාර්ථයන් අතට ගත් නෙල්ලි ගෙඩියක් ලෙසින් වටහා ගත් නිසා බුදුරදුන් ........................ ගුණයෙන් හඳුන්වනු ලබයි.
(1) සම්මා සම්බුද්ධ (2) විජ්ජාචරණ (3) භගවා (4) අනුත්තර (5) ලෝකවිදූ

19. **නත්ථානන්ද තථාගතස්ස ධම්මේසු ආචරිය මුට්ඨි** යන මහා පරිනිබ්බාණ සූත්‍රයේ ඇතුළත් දේශනාව බුදුරජාණන් වහන්සේගේ ........................ ප්‍රකට කරයි.
(1) මහා ප්‍රඥාව. (2) තාදි ගුණය. (3) නිදහස් චින්තනය.
(4) විශිෂ්ට ශාස්තෘත්වය. (5) මහා කරුණාව.

20. පහත දැක්වෙනුයේ බුදුරදුන්ගේ මහා ප්‍රඥාව ප්‍රකට කරන විවිධ වූ ඥාන වර්ගයන්ගෙන් කිහිපයකි.

**A** මනෝමය ඉද්ධි ඥානය **B** ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය **C** යථාභූත විපාක ඥානh

**D** දිබ්බචක්ඛු ඥානය **E** ඉද්ධිවිධ ඥානය **F** ආසයානුසය ඥානය

මෙම ඥානයන්ගෙන් අෂ්ට විද්‍යා නම් වූ ඥානයට ඇතුළත් වන්නේ

(1) A, D සහ E වල ය. (2) A, C සහ D වල ය. (3) B, Dසහ E වල ය.

(4) B, C සහ F වල ය. (5) C, D සහ F වල ය.

21. පහත සඳහන් ප්‍රකාශන අතරින් බුදුරදුන්ගේ මහා කරුණාවට අදාළ ප්‍රකාශය කුමක් ද?

(1) කොසොල් රජතුමාගේ අසදෘස දානය පිළිගැනීම.

(2) සකුළුදායි පිරිවැජියාගේ අසපුවට වැඩම කිරීම.

(3) මට්ටකුණ්ඩලී වැතිර සිටි ස්ථානයෙන් වැඩම කිරීම.

(4) අන්තගාමී නොවී මැදිහත් පිළිවෙතක් අනුගමනය කිරීම

(5) උපාලි ගෘහපති පුත්‍රයාට විමසා කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දීම.

22. බුදුරජාණන් වහන්සේ වරක් චම්පා නුවරට වැඩම කළපසු එගම නායක බමුණෙක් උන්වහන්සේ දැකීමට යාමට සූදානම් විය. ඔහුගේ සහචරයෝ ඒ ගමන වැළැක්වීමට විවිධ කතා කීහ. එහිදී බුදුරදුන්ගේ ගුණ කදම්බය වර්ණනා කළ නායක බමුණා සෙසු බමුණු පිරිස ද කැටිව බුදුරදුන් වෙත පැමිණියේ ය. එම බමුණා වූයේ .

(1) අග්ගිකභාරද්වාජ ය. (2) කසීභාරද්වාජ ය. (3) සුන්දරීකභාරද්වාජ ය.

(4) අක්කෝසකභාරද්වාජ ය. (5) සෝණදණ්ඩ ය.

23. 'නූතන විද්‍යාත්මක චින්තනයට පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහම යි.' යන මෙම ප්‍රකාශය කරනු ලැබුවේ,

(1) එච්.ජී. වේල්ස් විසිනි. (2) බර්ට්‍රන්ඩ් රසල් විසිනි. (3) එඩ්වින් ආර්නෝල්ඩ් විසිනි

(4) ඇල්බට් අයින්ස්ටයින් විසිනි. (5) රීස් ඩේවිඩ්ස් විසිනි.

24. ආනන්දතෙරුන් වහන්සේගේ පූර්ණ අනුග්‍රහය ද ඇති ව අෂ්ට ගරුධර්ම පිළිගත් මහා ප්‍රජාපතී ගෝතමිය විශාලා මහනුවර කූටාගාර ශාලාවේ දී ........................ පැවිදි උපසම්පදාව ලැබී ය.

(1) සම්බුද්ධත්වයෙන් පස් වන වසරේ දී (2) සම්බුද්ධත්වයෙන් හත් වන වසරේ දී

(3) සම්බුද්ධත්වයෙන් සිව් වන වසරේ දී (4) සම්බුද්ධත්වයෙන් අට වන වසරේ දී

(5) සම්බුද්ධත්වයෙන් තෙවන වසරේ දී

25. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කළ දින පැවිදි වූ ආනන්ද මහ තෙරුන් වහනසේ, සම්බුද්ධත්වයෙන් විසි වන වසරේ දී ආයාචනා හතරක් හා ප්‍රතික්ෂේප හතරක් ඉදිරිපත් කොට නිත්‍ය උපස්ථායක ධුරයට පත් වූහ . එයින් ආනන්ද මහ තෙරුන් වහන්සේගේ ප්‍රතික්ෂේප හතරට අයත් නොවන්නේ,

(1) බුදු රජාණන් වහන්සේට කෙරෙන ආරාධනාවලට තමා පිටත් කර නො හැරිය යුතු බව.

(2) පිටින් පැමිණෙන කවරකු හෝ කැමති වේලාවක බුදු රජාණන් වහන්සේ මුණ ගැස්වීමට අවසර නොදිය යුතු බව.

(3) බුදු රජාණන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය තමාට නොදිය යුතු බව.

(4) බුදු රජාණන් වහන්සේ වසන එක ම ගඳකිළියේ තමාට විසීමට ඉඩ නො දිය යුතු බව .

(5) බුදු රජාණන් වහන්සේට ලැබෙන චීවර තමාට නොදිය යුතු බව.

26. අනේපිඬු සිටුතුමන් සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් මහඟු මෙහෙවරක් සිදුකළ බුදුරදුන්ගේ පවා ඇගයීමට ලක්වූ සැදැහවත් උපාසකයෙකි. එතුමන්ගේ ශාසනික සේවා ලැයිස්තුවට ඇතුළත් නොවන්නේ මින් කුමක් ද?

(1) ජේතවන විහාරය ඉදිකොට බුදු සසුනට පූජා කිරීම වෙනුවෙන් කහවනු පනස් හතරකෝටියක් වැය කිරීම

(2) අනේපිඬු සිටුතුමන්ගේ සේවිකාවක වූ කුජ්ජුත්තරා දාසි බවින් නිදහස් කිරීම.

(3) තම පුත් "කාල" දහමට නැඹුරුකරවා ගැනීමට මහත් වෙහෙසක් දැරීම.

(4) බුදු රදුන්ට උපස්ථාන කිරීම සඳහා දිනකට තෙවතාවක් දෙව්රම් වෙහෙරට යාම.

(5) දිනපතා තම නිවසින් භික්ෂූන් වහන්සේලා පන්සිය නමකට දන් පිළිගැන්වීම.

27. අත්තකාර, පරකාර, ආරම්භ ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු ආදී පාරිභාෂික වචන මගින් බුදු සමය අවධාරණය කරන ඉගැන්වීම සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය කුමක් ද?
(1) කර්ම විපාකයෙන් ගැළවීමට කිසිවෙකුට හැකියාවක් නැත.
(2) බියජනක සසර ජය ගැනීමට නිරන්තරයෙන් ක්‍රියා කළ යුතු ය.
(3) පුද්ගලයා යනු හේතුඵල සම්බන්ධයේ ප්‍රතිඵලයකි.
(4) ආත්මාර්ථය පිණිස මෙන් ම පරාර්ථය පිණිස ද එකසේ ක්‍රියා කළ යුතු ය.
(5) පුද්ගල ස්වාධීනත්වය හා ශක්තිය මගින් පෞරුෂය ගොඩ නගාගත හැකි ය.

28 ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය, නියතිවාදය වැනි ඉගැන්වීම් වලින් පුද්ගලයා පාලනය කිරීමේ බලය පවරාදී ඇත්තේ
(1) බාහිර පුද්ගලයෙක් වෙත ය. (2) බාහිර බලවේගයකට නොව තමාට ය.
(3) ලෝකය මවා පාලනය කරන නිර්මාපකයාට ය. (4) පෙර කරන ලද කර්මයට ය.
(5) තමාට නොපෙනෙන බාහිර බලවේගයකට ය.

29. තමාට තමා හැර වෙනත් පුද්ගලයෙකු හෝ තමා පාලනය කරන අදෘශ්‍යමාන බලවේගයක් නොමැත යන හැඟීම තුළින් අර්ථවත් වන්නේ,
(1) පුද්ගල පාරිශුද්ධත්වයයි (2) පුද්ගල ස්වාධිනත්වයයි (3) පුද්ගල ස්වාමිත්වයයි
(4) පුද්ගල ස්වච්ඡන්දතාවයි (5) පුද්ගල වගකීමයි

30. හේතුඵලවාදී ව සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය විස්තර කරන දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි පව් බැහැර කළ පිරිස බ්‍රාහ්මණයින් ලෙස හඳුන්වාදී ඇත. ඔවුහු ඣායක හා අජ්ඣායක වශයෙන් දෙකොටසකට බෙදුන බව ද විස්තර වේ. මෙහි සඳහන් ඣායක බ්‍රාහ්මණයින්ගේ ලක්ෂණයකි.
(1) දැහැමි ජීවිතයක් ගත කරමින් ජන සමාජය තුළ වාසය කිරීම.
(2) අලංකාරවත් වූ කුඩා කුටි ඉදිකරගෙන වාසය කිරීම.
(3) ත්‍රිවේදය පිළිබඳ ග්‍රන්ථකරණයෙහි නියෙලෙමින් කටයුතු කිරීම.
(4) වනගත ව භාවනානුයෝගී ව කටයුතු කිරීම.
(5) විවිධ ආගමික සංස්කාරයන්හි නියෙලෙමින් කටයුතු කිරීම.

31. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි සඳහන් පරිදි වෛශ්‍ය වර්ණයෙහි සුවිශේෂි ලක්ෂණය වන්නේ,
(1) දන්දෙමින් කාමභෝගී ජීවිතයක් ගත කිරීමයි.
(2) ඉගෙන ගනිමින් ආගමික ජීවිතයක් ගත කිරීමයි.
(3) කෘෂිකර්මාන්තයන්හි නිරතවෙමින් දැහැමි ජීවිතයක් ගත කිරීමයි.
(4) මෛථුන්දම් සේවනයෙහි යෙදෙමින් විවිධ කර්මාන්තවල නියැලීමයි.
(5) රළු වැඩ හා පහත් වැඩවල නියෙලෙමින් කටයුතු කිරීමයි.

32. මවුවරුන් ලෙස කාන්තාවෝ දරුවන් බිහිකොට, ඇති දැඩි කරමින් සමාජය ගොඩනගති. මේ නිසා ඔවුන්ට විශේෂ ආරක්ෂාවක් සැලසිය යුතු ය. එවැනි ආරක්ෂාවක් සලසන රාජ්‍ය ප්‍රතිපත්තිය වන්නේ,
(1) සතර සංග්‍රහවස්තු ය. (2) සප්ත අපරිහානීය ධර්ම ය. (3) දස සක්විතිවත් ය
(4) දස රාජ ධර්ම ය. (5) පඤ්ච ශීල ප්‍රතිපත්ති ය.

33 දීඝ නිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රය තුළින් සමාජය තුළ ක්‍රමයෙන් අසද් ධර්ම ඇතිවීමට හේතුවත් ඇති වූ අසද් ධර්මයනුත් හේතුඵල සම්බන්ධතාවෙන් යුතුව ඉදිරිපත් කර ඇත. ඒවා අපිළිවෙළින් පහත දැක්වේ.
A - බොරුකීම B - ප්‍රාණඝාතය C - අවි ආයුධ භාවිත ය
D - දිළිඳුකම E - සොරකම
මෙම කරුණු සූත්‍රයට අනුරූපී ව පිළිවෙලළින් පෙළගැස්වූ වරණය තෝරන්න.
(1) A, B,C D, E, ය. (2) D,E,C,B,A ය. (3) C, B, A,D,E ය.
(4) B, C,A,E,D ය. (5) B,A,E,C, D ය.

34. සියලු රටවැසියන්ට පමණක් නො ව පක්ෂීන්ට සිව්පාවුන්ට පවා දැහැමි රැකවරණය සැලසීම, සිය රටෙහි අධාර්මික ක්‍රියාවලට ඉඩ නොතැබීම දිළිඳුභාවය දුරු කොට ආර්ථික සංවර්ධනය පිණිස කටයුතු කිරීම යන කරුණු ඇතුළත් වන බෞද්ධ දේශපාලන මූලධර්මය හඳුන්වන්නේ

(1) දස සක්විතිවත් නමිනි. (2) සතර සංග්‍රහ වස්තු නමිනි. (3) දසරාජ ධර්ම නමිනි.
(4) සප්ත අපරිහානීය ධර්ම නමිනි. (5) දස පින්කිරිය වත් නමිනි.

35. පාලන තන්ත්‍රය විෂයෙහි ජනතාව ද විශාල දායකත්වයක් දැරිය යුතුබව අග්ගඤ්ඤ සූත්‍රයෙහි සඳහන් ඇතැම් විවරණයන් තුළින් මනාව පිළිබිඹු වේ. එම විවරණය තුළින් අර්ථවත් වන්නේ,

(1) ආපදාපන්න අවස්ථාවන්හි දී අපහසුතා විඳ දරගැනීමට ගිවිස ගැනීමයි.
(2) පොදු දේපොළ අවභාවිතයට ගැනීමෙන් වැළකීමට ගිවිස ගැනීමයි.
(3) නිසි පරිදි බදු ගෙවීමට ගිවිස ගැනීමයි.
(4) අධි පරිභෝජනයෙන් වැළකී ක්‍රියාකිරීමට ගිවිස ගැනීමයි.
(5) කාලය අපතේ නොයවා සේවා සපයන බවට ගිවිස ගැනීමයි.

36 බෞද්ධ ඉගැන්වීම් අනුව හොඳ නරක විනිYචය පිණිස වඩාත් නිවැරදි නිර්ණායකය ලෙස සැලකිය හැක්කේ

(1) ස්වාධීන චින්තනයට හා හෘදය සාක්ෂියට අනුරූප වන දේ නිවැරදි යැයි පිළිගැනීමයි.
(2) පිටක ග්‍රන්ථවල දැක්වෙන විවරණ නිවැරදි යැයි පිළිගැනීමයි.
(3) ගුරුවරයා ඉගැන්වූ දේ නිවැරදි යැයි පිළිගැනීමයි.
(4) තමන්ගේ න්‍යායට තර්කයට අනුරූප වන දේ නිවැරදි යැයි පිළිගැනීමයි.
(5) පරම්පරාගතව පැවැත එන අදහස් නිවැරදි යැයි පිළිගැනීමයි.

37. සිරිදාස සතුන්ට උගුල් අටවා සතුන් මරා එම මස් විකුණා උපයන මුදල් හා සොරකමින් උපයන මුදල් මත්ද්‍රව්‍ය භාවිතයට හා සුදුවට යොදවයි. එපමණක් නො ව අනුන්ගේ පවුල් ජීවිතවලට බලපෑම් ඇතිවන ආකාරයට කේලම් කියමින් පරදාර සේවනයෙහි යෙදෙමින් ගමේ කඩපිල්වල කාලය ගත කරමින් මිථ්‍යා මත ඉදිරිපත් කරන පවිටු මිනිසෙකි. සිරිදාසගේ මේ චර්යා රටාවෙහි දස අකුසලයන්ට අදාළ ක්‍රියාකාරකම් ගණනාවක් දක්නට ලැබේ. එම අකුසල සංඛ්‍යාව කොපමණ ද?

(1) අටකි. (2) හතකි. (3) හයකි. (4) පහකි. (5) හතරකි.

38. දස පිං කිරියවත්හි එන පිදිය යුත්තන් පිදීම ....................................... යනුවෙන් හැඳින්වේ.

(1) පත්තිදාන (2) පත්තානුමෝදනා (3) වෙයාාවච්ච (4) උපට්ඨාන (5) අපචායන

39. ගිහි බෞද්ධයා ආශාවන් පසුපස හඹායාම වෙනුවට ආශාවන් අඩුකර ගැනීමට කටයුතු කරයි. අතෘප්තිකර ස්වභාවය සමනය කර ගෙන තෘප්තිමත් සරල දිවිපෙවතකට හුරුවෙයි. මෙම ප්‍රකාශයෙන් කියවෙන්නේ,

(1) හිරි ඔතප් දෙක පිළිබඳවයි (2) සංතුට්ඨිතාව පිළිබඳවයි (3) අල්පේච්ඡතාව පිළිබඳවයි
(4) අල්පකෘත්‍යතාව පිළිබඳවයි (5) සුභරතාව පිළිබඳවයි

40. පහත සඳහන් ප්‍රකාශන අතරින් ශ්‍රද්ධාව පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) ශ්‍රද්ධාව ආකාරවතී හා අමූලිකා වශයෙන් දෙයාකාර වේ
(2) තෙරුවන් පිළිබඳ ව ඇති කරගන්නා වූ පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාව නම්වේ.
(3) ආකාරවතී ශ්‍රද්ධාව බුද්ධි ගෝචර වූවකි.
(4) ශ්‍රද්ධාවන්තයා සිල්වතුන් දැකීමට කැමැත්තක් දක්වයි.
(5) අමූලිකා ශ්‍රද්ධාව ප්‍රඥාවෙන් තොරවූවක් නොවේ.

41. නීති ගරුකත්වය හා සහජීවනයට අදාළ කරගත හැකි ප්‍රකාශ ගණනාවක් පහත දැක්වේ. ඒ ප්‍රකාශන අතරින් එකක් එයට අදාළ නොවේ. අදාළ නොවන එම ප්‍රකාශය තෝරන්න.

(1) නීතිගරුකත්වය අපරිහානීය ධර්මයකි.
(2) නීතිගරුකවීම සාමූහික පැවැත්මට හා සමගියට හේතුවේ.
(3) මිනිසා වරදට පොලඹවන හේතු නැති කොට අපරාධ නැති කිරීම බෞද්ධ පිළිවෙත වේ.
(4) දඬුවම අපරාධ මර්දනය කිරීමේ එක ම ක්‍රියාමාර්ගය ලෙස බුදු දහම පෙන්වා දේ.
(5) නීති ගරුකත්වයේ අවශ්‍යතාව ශික්ෂාපද පැනවීමේ පරමාර්ථ තුළින් පැහැදිලි වේ. .

42. පංචශිඛ නම් ගාන්ධර්වයා බුදුරදුන් වෙත පැමිණ බේලුව පණ්ඩු වීණාව වාදනය කරමින් සිය පෙම්වතිය වෙනුවෙන් ප්‍රබන්ධිත ගී පෙළක් ගායනා කළේ ය. මෙහිදී බුදුරජාණන් වහන්සේ පංචශිඛගේ ගායන වාදන දක්ෂතාව ඇගයීමට ලක්කළ හ. මෙම සිද්ධිය සඳහන් වන්නේ

(1) සක්ක පඤ්හ සූත්‍රයේ ය. (2) මහා මංගල සූත්‍රයේ ය. (3) සිගාලෝවාද සූත්‍රයේ ය.
(4) ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ය. (5) මහාපරිනිබ්බාණ සූත්‍රයේ ය.

43. "ඉදින් කුළ පුත්‍රය ස්වල්ප ආදායමක් ඇති ව බොහෝ වියදම් කෙරේද දිඹුල එල කා දමන්නෙකු මෙන් හෙතෙම වස්තුව කා වැනසෙන්නකි කියාද බොහෝ ආදායම් ඇති ව දුකසේ දිවි ගෙවයි ද හෙතෙම නොකා නොබී මැරෙන්නකි "කියා ද පවසන්නෝ වෙති. මෙම ප්‍රකාශයන්ගෙන් ගම්‍ය වන්නේ

(1) සම්පත් කළමනාකරණය පිළිබඳ අදහසකි. (2) භෝග විනාස මුඛ පිළිබඳ අදහසකි.
(3) ධනෝපායනය පිළිබඳ අදහසකි. (4) සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳ අදහසකි.
(5) භෝග සුඛය පිළිබඳ අදහසකි.

44. බුදුසමය පරිසරය සම්බන්ධ ව ඉදිරිපත් කෙරෙන ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A – මල් පල උයන්වතු හා වන වගාකිරීම දිවා රෑ පිං වැඩෙන පිංකම් වේ.
B - ජලයෙහි මළමුත්‍ර පහකිරීම කෙළ ගැසීම භික්ෂූන්ට ඇවැතකි.
C - "වනය (කෙලෙස් ) සිඳින්න. ගස් කපන්න එපා." යන්න ප්‍රකට බෞද්ධ ඉගැන්වීමකි.
D - නිල් තණ මත මළ මුත්‍ර පහකිරීම, කෙළ ගැසීම, භික්ෂූන්ට ආපත්තියකි.
E - ගස්වැල් සිඳීම හා සියලු ආකාරයේ පැළවෙන බීජ සිඳීම භික්ෂූන්ට අකැප ය.

නිකායේ ඉහත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණයෙහි ලා අනුබල දෙන කරුණු ඇතුළත් වඩාත් නිවැරදි වරණය තෝරන්න.

(1) A පමණි. (2) A, B පමණි. (3) A, B, C පමණි.
(4) A, B, C,D පමණි. (5) A, B, C, D, E යන පහම වේ.

45. බුදු සමය .......................................පඤ්චබලි සංකල්පයෙන් පැහැදිලි කරයි.

(1) ධනෝපායනය පිළිබඳ ක්‍රමවේදක් (2) ධන සංරක්ෂණය පිළිබඳ ක්‍රමවේදයක්
(3) ධනපරිභෝජනය පිළිබඳ ක්‍රමවේදයක් (4) ධන පරිහානිය පිළිබඳ ඉගැන්වීමක්
(5) ධන ආයෝජනය පිළිබඳ නිර්දේශයක්

46. සාර්ථක ගිහි ජීවිතයක පැවැත්ම සඳහා අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ, අණවජ්ජ සුඛ යන සිව් වැදෑරුම් ලෞකික සුඛ අවශ්‍ය බව බුදු දහම පෙන්වා දෙයි. මේ අතරින් භෝග සුඛය නමින් හැඳින්වෙන්නේ

(1) ධාර්මික ව උපයාගත් සම්පත් තමන් සතුව ඇතැයි ලබන සතුටයි.
(2) ධාර්මික ව උපයාගත් සම්පත් අර්ථවත් ව වැය කරමින් මැනවින් පරිභෝග කරමින් ලබන සතුටයි.
(3) ධාර්මික ව උපයාගත් සම්පත් තමන් දානාදී යහපත් කටයුතු සඳහා වැය කිරීමෙන් ලබන සතුටයි.
(4) ණය නොවී උපයාගත් සම්පත් තමන් සතු ව ඇතැයි ලබන සතුටයි.
(5) ධාර්මික ව උපයාගත් සම්පත් යුතුකම් ඉටුකිරීමට යෙදවීමෙන් ලබන සතුටයි.

47."අගථිතෝ, අමුච්ඡිතෝ, අනජ්ඣාපන්නෝ, ආදිනව දස්සාවි, නිස්සරන පඤ්ඤාය" යන පාරිභාෂිත වචනවලින් විග්‍රහ කර ඇත්තේ ධනය....................................පිළිබඳ දර්ශනයකි.

(1) ඉපයීම (2) පරිභෝජනය (3) සංරක්ෂණය (4) ආයෝජනය (5) කළමනාකරණය

48. ඇතැම් මිනිසුන් මිනිස්කමට පවා නිගාකරන අයුරින් සාහසික හා විවිධ කූට උපක්‍රම භාවිත කරමින් ධනය ඉපයීමට පෙලඹේ. තුලාකූට, මානකූට, කංසකූට, උක්කෝටන යනුවෙන් දැක්වෙන්නේ එයින් කිහිපයකි. මෙහි සඳහන් **උක්කෝටන** යන්නෙන් අදහස් කරනුයේ,

(1) අල්ලස් ගැනීම් හා උපාය මගින් අනුන් රැවටීමයි.
(2) රන් නොවන දේ රන් ලෙසත් මැණික් නොවන දේ මැණික් ලෙසත් වංචා කිරීමයි.
(3) කෙත්වතු ආදිය මනින විට කෙත් හිමියාට අවාසි වන ලෙස මැනීමයි.
(4) තරාදියෙන් සිදුකරන කිරීම් ආදියෙන් සිදුකරන වංචාවන් ය.
(5) මැනීම් ආදිය සිදුකරනවිට සිදුකරන ලද වංචාවන් ය.

49. පුද්ගල හා සමාජ සංවර්ධනයට අදාළ බෞද්ධ සාර ධර්ම අතර රියසකට කඩ ඇණය මෙන් සමාජයේ යහ පැවැත්මට .......................... හේතුවන බව අවධාරණය කර ඇත,

(1) සතර බ්‍රහ්ම විහරණ (2) හිරි ඔතප් (3) පඤ්ච සීල ප්‍රතිපදාව
(4) සතර සංග්‍රහ වස්තු (5) ශ්‍රද්ධාව

50. පහත දැක්වෙන ශික්ෂාපද අතරින් අටසිල්වලට පමණක් අයත් වන්නේ

(1) කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි
(2) නච්චගීතවාදිතවිසූකදස්සනා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි
(3) පරුෂාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි
(4) අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි
(5) මිච්ඡාජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

# බෞද්ධ ශිෂ්ටාචාරය - II

කාලය පැය 03 යි

නම/ විභාග අංකයඃ

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

---

උපදෙස් :- i කොටසින් ප්‍රශ්න දෙකක් ද ii කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## i කොටස

1. (i).වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම හතරක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii).වානප්‍රස්ථ ආශ්‍රමයට අදාළ ක්‍රියාකාරකම් තුනක් හඳුන්වා දෙන්න. (ලකුණු 3යි)

(iii).යාගයක් අංග සම්පූර්ණ වීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා හතරක් සැකෙවින් දක්වන්න (ලකුණු 4යි)

(iv) ගිහි සමාජයතුළ කාන්තාව බුදු දහමින් ඇගයීමට ලක්වී ඇති අයුරු නිදසුන් හතරක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 5යි)

(v) බුදුරදුන් දවස භාරතීය සමාජය වාණිජකරණයට ලක්ව පැවැති බව සාධක පහක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6යි)

2. (i) ගණතන්ත්‍ර පාලනයන් (සමූහාණ්ඩු) පැවැති රාජ්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii). රාජාණ්ඩු පාලන ක්‍රමයක ප්‍රමුඛ ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 3යි)

(iii). බුදු රජාණන් වහන්සේ සමඟ පාලකයන් පැවැත්වූ සම්බන්ධතාව නිදසුන් හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න. . (ලකුණු 4යි)

(iv) බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ ප්‍රමුඛ ලක්ෂණ පහක් විමසීමට ලක්කරන්න (ලකුණු 5යි)

(v) අජිත කේෂකම්බලී ශාස්තෘවරයාගේ ඉගැන්වීම් තුළින් සමාජ සදාචාරයට සිදුකරන අහිතකර බලපෑම විස්තර කරන්න. (ලකුණු 6යි)

3.(i). විජ්ජාචරණ බුදුගුණයට අදාළ අෂ්ට විද්‍යාවන්ගෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii) බුද්ධ චරිතයෙන් පුරිස දම්ම සාරථී ගුණය ප්‍රකට කෙරෙන අවස්ථා තුනක් පෙන්වා දෙන්න.(ලකුණු 3යි)

(iii) බුදුරජාණන් වහන්සේගේ මහාකාරුණික ගුණය නිදසුන් හතරක් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 4යි)

(iv). ධර්ම දේශනාවන්හි දී බුදුරදුන් විවිධ ක්‍රමෝපායන් භාවිතයට ගත් අයුරු නිදසුන් මගින් විස්තර කරන්න (ලකුණු 5යි)

(v). ආනන්ද හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ හතරක් ගෙනහැර දක්වන්න. (ලකුණු 6යි)

## ii කොටස

4. (i). අග්ගඤ්ඤ සූත්‍රාගත ඉගැන්වීම් තුළින් සමාජ සංස්ථාවන්හි ප්‍රභවය පිළිබඳ හේතුඵලවාදී විවරණයක් කෙරෙන අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 10යි)

(ii). බෞද්ධ දේශපාලන සංකල්ප මානව හිතවාදී පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමට හේතු වන අයුරු විමසන්න. (ලකුණු 10යි

5. (i). හොඳ නරක ක්‍රියාකාරකම් විනිසශ්චයෙහි ලා බුදුසමය අනුදත් බෞද්ධ නිර්ණායකයන් ගෙනහැර දක්වන්න. (ලකුණු 10යි)

(ii) දස පින්කිරියවත් ගුණගරුක සමාජයක් ගොඩනගා ගැනීමට උපකාරීවන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10)

6. (i) ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පුද්ගලයා තුළ ආත්ම විශ්වාසය ගොඩනැංවීම පිණිස ඉවහල්වන බව පෙන්වා දෙන්න. (ලකුණු 10යි)

(ii). මහිච්ඡතාව නිසා ඇතිවන සමාජ ප්‍රශ්න නිරාකරණය කරගැනීමට අල්පේච්ඡතාව ඉවහල්වන අයුරු විමසීමට ලක්කරන්න. (ලකුණු 10යි)

7. (i). මානව අයිතීන් සුරක්ෂිත කොට සමාජ සහජීවනය උදාකරලීමට පංච ශීල ප්‍රතිපදාවෙන් ලැබෙන පිටුබලය ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10යි)

(ii). බුදු දහම සෞන්දර්ය විරෝධී දහමක් නොවන බව නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

8. (i). පරිසර සංරක්ෂණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් වත්මන් පාරිසරික ගැටලු අවම කර ගැනීමට උපකාරීවන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii). පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න

(1) ආපද් ධර්ම
(2) අටසිල්
(3) සුභරතාව
(4) භෝග සුඛය (ලකුණු5x2= 10යි)

---

⋆ ⋆ ⋆

---

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය - 2023

12 ශ්‍රේණිය **බෞද්ධ ශිෂ්ටාචාරය** පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 4 ) | 02. ( 3 ) | 03. ( 2 ) | 04. ( 1 ) | 05. ( 3 ) | 06. (4 ) | 07. ( 3 ) | 08. ( 3 ) | 09. ( 2 ) | 10. ( 3 ) |
| 11. ( 5 ) | 12. ( 4 ) | 13. ( 5 ) | 14. ( 2 ) | 15. ( 5 ) | 16. (1 ) | 17. ( 4 ) | 18. ( 1 ) | 19. ( 4 ) | 20. ( 1 ) |
| 21. ( 3 ) | 22. ( 5 ) | 23. ( 2 ) | 24. ( 1 ) | 25. ( 2 ) | 26. (2 ) | 27. ( 5 ) | 28. ( 5 ) | 29. ( 3 ) | 30. ( 4 ) |
| 31. ( 4 ) | 32. ( 2 ) | 33. ( 2 ) | 34. ( 1 ) | 35. ( 3 ) | 36. (1 ) | 37. ( 4 ) | 38. ( 5 ) | 39. ( 3 ) | 40. ( 5 ) |
| 41. (4 ) | 42. ( 1 ) | 43. ( 1 ) | 44. ( 5 ) | 45. ( 3 ) | 46. ( 2) | 47. ( 2) | 48. (1 ) | 49. ( 4) | 50. ( 4) |

## 11 f l dg i

1. (i).වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම හතරක් නම් කරන්න.

පශු පාලනය, දන් දීම, යාග කිරීම, ඉගෙනීම, වෙළෙඳාම, මුදල් පොළියට දීම, කෘෂි කර්මාන්තය (ලකුණු 2යි)

(ii).වානප්‍රස්ථ ආශ්‍රමයට අදාල ක්‍රියාකාරකම් තුනක් හඳුන්වා දෙන්න.

තවුස්දම් රැකීම සඳහා වනගතවීම, දරු මුණුපුරන් ලැබීමෙන් පසු භාර්යාව සමග හෝ හුදකලාව වනගතවීම, කාමභෝගී ජීවිතයෙන් සම්පූර්ණයෙන් ම ඉවත්වීම, වනයෙන් සොයාගන්නා ලද පලවැල ආහාරයට ගනිමින් හෝ පිඬු සිගායාමෙන් යැපීම, හෝම ගින්න නොනිමා පවත්වාගෙන යාම, ආගමික අංශයට නැඹුරුව ආත්මය මුදවා ගැනීමට කටයුතු කිරීම (ලකුණු 3යි)

(iii).යාගයක් අංග සම්පූර්ණ වීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා හතරක් සැකෙවින් දක්වන්න

පූජක බ්‍රාහ්මණයින් හතර දෙනෙක් සිටිය යුතුවීම, සුභ නැකතින් කප සිටුවීම කළ යුතුය, වේද ගීතිකා ගායනය ආරම්භයේ සිට අවසන් වනතුරු ගිණි පූජාව පැවැත්විය යුතුය. පූජාසනය මත පූජා ද්‍රව්‍ය තැන්පත් කළ යුතුය, ඒ ඒ යාගයට ගැලපෙන බිළි පූජා පැවැත්විය යුතුය.
(ලකුණු 4යි)

(iv) ගිහි සමාජයතුළ කාන්තාව බුදු දහමින් ඇගයීමට ලක්වී ඇති අයුරු නිදසුන් හතරක් ඇසුරෙන් පහදන්න.

මෙහිදී මවක, බිරිඳක්, දියණියක් වශයෙන් හා උපාසිකාවක් වශයෙන් බුදුරදුන්ගේ ඇගයීමට ලක් වූ අවස්ථා ඉදිරිපත්විය යුතුය. එහිදී මෙම භූමිකා හතරින් එක් භූමිකාවක් සම්බන්ධයෙන් වුව නිදසුන් හතරක් ඇසුරු කරගෙන පිළිතුර ගොඩනා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න. (ලකුණු 5යි)

(v) බුදුරදුන් දවස භාරතීය සමාජය වාණිජකරණයට ලක්ව පැවැති බව සාධක පහක් ඇසුරෙන් විස්තර කරන්න.

භාණ්ඩ හුවමාරු ක්‍රමයෙන් ඈත්ව මුදල් භාවිතයට යොමුවීම(මස්ස, අඩමස්ස, කහවනුව), බැංකු කටයුතු පැවැතීම ( ණය දීම, ණය ගැනීම),වෙළඳ නගර නිර්මාණය වීම ( බරණැස, උදේනි,පාඨලී පුත්‍ර), විනෝදාස්වාදය ගෙනදෙන සැණකෙළි පැවැත්වීම (ගිරග්ග සමජ්ජ), සුරාසැල්, ගණිකා නිවාස, ඔට්ටුපොළවල් වාණිජ කරණයත් සමග ඇතිවීම, මුදල් ඔට්ටුවට තබා සූදු ක්‍රීඩා පැවත්වීම, භාෂාව, අදහස් උදහස්, ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ආදියෙහි වෙනස්කම් ඇතිවීම, දේශීයමාර්ග පද්ධති දියුණුවී ජාත්‍යන්තර මාර්ග හා බද්ධවීම (සේද මාවත),උසස් වංශිකයන්ගේ හා සිටුවරුන්ගේ දරුවන් තක්ෂිලා වැනි විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලැබීම, නගරය තුළ ඇති නැති පරතරය වැඩිවී ධනවතුන් මෙන්ම දුප්පතුන්ද සිටීම (ලකුණු 6යි)

2. (i) ගණතන්ත්‍ර පාලනයන් (සමූහාණ්ඩු) පැවැති රාජ්‍ය දෙකක් නම් කරන්න.

වජ්ජි, මල්ල (ලකුණු 2යි)

(ii). රාජාණ්ඩු පාලන ක්‍රමයක ප්‍රමුඛ ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න.

මහරජ කෙනකු විසින් පාලනය කිරීම. බොහෝ විට පිය පුතු පරපුරෙන් රජ පදවිය උරුම වීම. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල රජුට හිමි වීම. රජතුමා නීති පැනවීම, නීති ක්‍රියාත්මක කරවීම හා දඬුවම් පැමිණවීම. යුවරජ, පුරෝහිත, අධිකරණ නායක, සේනාධිපති මඟින් බලය ක්‍රියාත්මක වීම. දුර්වල අසල්වැසි රාජ්‍යවල පාලකයන් පරදවා තම බලය පුළුල් කර ගැනීමට 'මත්ස්‍ය න්‍යාය' ක්‍රියාත්මක කිරීම. (ලකුණු 3යි)

(iii). බුදු රජාණන් වහන්සේ සමග පාලකයන් පැවැත්වූ සම්බන්ධතාව නිදසුන් හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න. .

මගධ,කෝසල, වත්ස, අවන්ති, වජ්ජි, මල්ල, වැනි රාජ්‍ය පාලකයින් විවිධාකාරයෙන් බුදුරදුන් සමග සම්බන්ධතා පැවැත් වූ අයුරු නිදසුන් මගින් පැහැදිලි කිරීමක් අවශ්‍යවේ. (ලකුණු 4යි)

(iv) බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ ප්‍රමුඛ ලක්‍ෂණ පහක් විමසීමට ලක්කරන්න

ෂන්සුන් ඉඳුරන් ඇති පිරිසිදු කසාවත් දරන, සංවර ඉරියවවුලනි 'යතු,, ශලිාදී ගණු ධර්මයන්ගෙන් යුතු, බිමට හෙළන ලද ඇස් ඇති, හිස රැවුළු මුඩු කළ, සන්සුන් ව ගමන් කරන, සුපටිපන්න ශ්‍රමණ පිරිසක් බව.
■පිණ්ඩපාතික ව එක් වේලේ පමණක් ආහාර ගන්නා, සරල දිවි පෙවෙතක් ගත කරන පිරිසක් බව.
අට ලෝ දහමින් කම්පා නොවීම, මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම, අතීතය හා අනාගතය පිළිබඳ ශෝක නොඋපදවන, වර්තමානයෙන් යැපෙන, ප්‍රසන්න පෙනුමෙන් යුතු ශ්‍රමණ පිරිසක් බව. (සමිද්ධි සූත්‍රය) පුද්ගල ස්වාමිත්වය අගය කළ පිරිසක් බව. පාරිශුද්ධ වූ කාය, වාක්, මනඃ කර්ම ඇති බව. අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධත්වයෙන් යුක්ත වූ බව. නිවන මූලික පරමාර්ථය කොට ගෙන ඊට අදාළ ප්‍රතිපත්ති පිරූ පිරිසක් බව. (ලකුණු 5යි)

(v) අජිත කේෂකම්බලී ශාස්තෘවරයාගේ ඉගැන්වීම් තුළින් සමාජ සදාචාරයට සිදුකරන අහිතකර බලපෑම විස්තර කරන්න.

මෙතුමන් ඉදිරිපත් කළ දසවැදෑරුම් සංකල්පය හා භෞතිකවාදී ඉගැන්වීම් තුළින් සදාචාරයට තැනක් හිමි නොවන අතර ඒ නිසාම මිනිසුන් ද තිරිසන් සතුන් තරමට පිරිහීමට ලක්වී සමාජයේ ප්‍රගමනය නවතින බව පිළිතුර තුළින් විස්තර විය යුතුය. විශේෂයෙන් දසවස්තුක මිථ්‍යා දෘෂ්ටිය දක්වා ඒ තුළින් සදාචාරයට සිදුකෙරෙන බලපෑම විස්තර විය යුතුය. (ලකුණු 6යි)

3.(i). විජ්ජාචරණ බුදුගුණයට අදාල අෂ්ට විද්‍යාවන්ගෙන් දෙකක් නම් කරන්න.

විපස්සනාඥාණය මනෝමයඉද්ධිඥාණය ඉද්ධිවිධඥාණය දිබ්බසෝතඥාණය පරචිතත්විජානනඥාණය පුබ්බේනිවාසානුස්සතිඥාණය දිබ්බචක්ඛුඥාණය ආසවක්ඛයඥාණය (ලකුණු 2යි)

(ii) බුද්ධ චරිතයෙන් පුරිස දම්ම සාරතී ගුණය ප්‍රකට කෙරෙන අවස්ථා තුනක් පෙන්වා දෙන්න.

තුන් බෑ ජටිලයන්, සච්චක, සෝණදණ්ඩ, අක්කෝසක අංගලිමාලවැනි මිනිස් පුරුෂයන් ද, ආලවක, සුචිරෝම, ඛරරෝම ආදි අමනුෂ්‍ය පුරුෂයන් ද, නාලාගිරි, අග්ගිසඛි, ධූමසිඛ, අපලාලනාගරාජ ආදි තිරිසන් ගත පුරුෂයන් ද වශයෙන් මෙසේ විශාල පිරිසක් දමනය කර ඇති බ. (ලකුණු 3යි)

(iii) බුදුරජාණන් වහන්සේගේ මහාකාරුණික ගුණය නිදසුන් හතරක් මගින් පෙන්වා දෙන්න.

සුනීත, සෝපාක, රජ්ජුමාලා, කිසාගෝතමී, මට්ටකුණ්ඩලී, පූතිගත්තතිස්ස තෙරුන්, හත්ථාලවක කුමරු, කෙත පාළු වූ ගොවියා, හදුවතිකා ඇතින්න ආදීන්ගේ කතා පුවත් මගින් මෙම ගුණය පිළිබිඹු වන බව. (ලකුණු 4යි)

(iv). ධර්ම දේශනාවන්හිදී බුදුරදුන් විවිධ ක්‍රමෝපායන් භාවිතයට ගත් අයුරු නිදසුන් මගින් විස්තර කරන්න

ඍජු දේශනා ක්‍රමය, (දම්සක් පැවැතුම් සූත්‍රය) සාකච්ඡා ක්‍රමය, (කන්දරක සූත්‍රය) උපමානුසාරී දේශනා ක්‍රමය, (රාහුලෝවාද සූත්‍රය, කසීභාරද්වාජ සූත්‍රය) පැවැරුම් ක්‍රමය, (චුල්ලපන්තක, කිසාගෝතමී වැනි අයට) දෘශ්‍යාදාරක ක්‍රමය (චුල්ලපන්තක,කිසාගෝතමී) ආදිය ඊට නිදසුන් වන බව.
(ලකුණු 5යි)

(v). ආනන්ද හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ හතරක් ගෙනහැර දක්වන්න.

තනතුරු පසුපස හඹා නොයාම, තනතුරට අදාල කාර්ය භාරයන් හැඳින නොපිරිහෙළා ඉටුකිරීමලැබූ තනතුර හා ලාභ ප්‍රයෝජන පිළිබඳව උඩගු නොවීම,ලාබ ප්‍රයෝජන අපේක්‍ෂාවෙන් කටයුතු නොකිරීම. පරාර්ථය වෙනුවෙන් කැපවීම,චෝදනා හා දෝෂාරෝපනවලට නොබියව මුහුණ දීම. තම ශාස්තෘවරයා කෙරෙහි අසීමිත ගෞරවයෙන් හා ශ්‍රද්ධාවෙන් යුක්තව කටයුතු කිරීම, උත්සහය හා දක්‍ෂතාව වර්ධනය කර ගැනීම, අනලස්ව වීර්යෙන් යුක්තව කටයුතු කිරීම, කරුණාවෙන් යුක්තවීම. ධාරණ හා ස්මරණ ශක්තිය උපරිම තත්ත්වයෙන් පැවැතීම, (ලකුණු 6යි)

## ii කොටස

4. (i). අග්ගඤ්ඤ සූත්‍රාගත ඉගැන්වීම් තුළින් සමාජ සංස්ථාවන්හි ප්‍රභවය පිළිබඳ හේතුඵලවාදී විවරණයක් කෙරෙන අයුරු පරීක්ෂා කරන්න.

අග්ගඤ්ඤ සූත්‍රයේ ඇතුළත් පුරාවෘතය තුළින් හේතුඵලවාදීව චතුර්වර්ණය නිර්මාණය වූ ආකාරය පිළිබඳව කරන විවරණය ඉදිරිපත්විය යුතුය. එය ආකස්මිකව ඇති වූවක් නොව සමාජය විසින් ඇතැම්විට සමාජ අවශ්‍යතා පදනම්කරගෙන ඇති වූවක් බව විවරණය විය යුතුය. (ලකුණු 10යි)

(ii). බෞද්ධ දේශපාලන සංකල්ප මානව හිතවාදී පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමට හේතු වන අයුරු විමසන්න.

දස රාජධර්ම, දස සක්විත්වත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, පඤ්ච සීල ප්‍රතිපදාව ආදී කොටගත් බෞද්ධ දේශපාලන සංකල්ප සෑම එකක්ම පාහේ ජනතාවට යහපත උදාකරලීමට සමත්වන බව මෙහිදී වෙන් වෙන් ව දක්වමින් විස්තර විය යුතුය. (ලකුණු 10යි

5. (i). හොඳ නරක ක්‍රියාකාරකම් විනිස්චයෙහිලා බුදුසමය අනුදත් බෞද්ධ නිර්ණායකයන් ගෙනහැර දක්වන්න.

මිනිසා විසින් සචේතනිකව කරනු ලබන ක්‍රියාකාරකම් පොදුවේ හොඳ නරක වශයෙන් වර්ගීකරනයට ලක්කල හැකිය. එම වර්ගීකරනයන් යම් යම් නිර්ණායකන් පදනම් කරගෙන සිදුකරන බවක් දක්නට ලැබේ.එබඳු නිර්නායකයන් කිහිපයක් බෞද්ධ ඉගැන්වීම් තුළින් හඳුනාගත හැකිය. චේතනාව හා විපාකය, අධිපති ධර්ම, අත්තූපනායික ධර්ම පර්යාය, කාලාම සූත්‍රයේ අතුලත් ඉගැන්වීම තුළින් සම්ප්‍රදායට වහල් නොවී තමාවිසින් විමසා බලා හොඳ නරක තේරුම් ගැනීමට අවස්ථාව සලසා දීම අම්බලට්ඨික රාහුලෝවාද හා ධම්මපදයේ ඇතුලත් මෙයට අදාල ගාථා හඳුනාගෙන පිළිතුර සකස්විය යුතුය. (ලකුණු 10යි)

(ii) දස පින්කිරියවත් ගුණගරුක සමාජයක් ගොඩනගා ගැනීමට උපකාරීවන අයුරු පැහැදිළි කරන්න.

දස පුන්‍ය ක්‍රියා නම් කොට ඒ එක් එක් පුන්‍ය ක්‍රියාවන් අන්තර්ගතය විස්තර කරමින් ඒවා අනුගමනය කිරීමට යොමුවීම තුළින් ගුණගරුක සමාජයක් ගොඩ නැගෙන බව විස්තරවිය යුතුය.
(ලකුණු 10)

6. (i) ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පුද්ගලයා තුළ ආත්ම විශ්වාසය ගොඩනැංවීම පිණිස ඉවහල්වන බව පෙන්වා දෙන්න.

සවච්ඡන්දතාව යනු නිදහසේ සිතා මතා තීරණ ගැනිමට තීරණ ක්‍රියාත්මක කිරීමට පුද්ගලයාට ඇති හැකියාවයි. බාහිර බලවේගයන්ට තමා පාලනය කිරීමට ඒ තුළින් අවස්ථාවක් නොලැබේ. කාලාම වීමංශක උපාලි ආදීකොටගත් සූත්‍ර ගණනාවක් තුළින් ස්වච්ඡන්දතාව පිළිබඳ විස්තර කෙරෙන බවත් ඒ තුළින් පුරුෂ බලය, පුරුෂ පරාක්‍රමය, පුරුෂවීර්ය වැනි ධනාත්මක හා පුද්ගල පෞරුෂය ස්මතු කෙරෙන බව විස්තරවිය යුතුය. (ලකුණු 10යි)

(ii). මහිච්ඡතාව නිසා ඇතිවන සමාජ ප්‍රශ්න නිරාකරනය කරගැනීමට අල්පේච්ඡතාව ඉවහල්වන අයුරු විමසීමට ලක්කරන්න.

මහිච්ඡතාව යනු ආශාවන් බහුල බවයි. අසීමිත ආශාවෙන් යුක්ත බවයි. අල්ලස, දූෂණය, හොරකම, මනුෂ්‍ය ඝාතන වැනි ටලු නිර්මානය වන බව විස්තරවිය යුතුය. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය පළිගැනීම, ආදී කොටගත් ආර්ථික, සාමාජික, බෙහෝ ගැටලු නිර්මාණය වන බව විස්තර විය යුතුය. ආශාවන් අපේක්ෂාවන් අඩුවීම තුළින් මෙම සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයෙන බ විස්තර විය යුතුය. (ලකුණු 10යි)

7. (i). මානව අයිතීන් සුරක්ෂිත කොට සමාජ සහජීවනය උදාකරලීමට පංච ශිල ප්‍රතිපදාවෙන් ලැබෙන පිටුබලය ඇගයීමට ලක්කරන්න.

ජීවත්වීමේ අයිතිය, තමා සන්තක දේ සුරක්ෂිතව පරිහරණය කරගැනීමේ අයිතිය, තමාගේ පවුල ජීවිතයට තෙවැන්කෙගේ මැදිහත්වීමෙන් තොරව කටයුතු කිරීමේ හැකියාව, බොරුවෙන් වංචාවෙන් තමන්ව මුලාවට පත්නොවී සිටීමට ඇති කැමැත්ත, සිහිය විකෘති නොවී පවත්වාගෙන යාමට සෑම පුද්ගලයෙක්ම කැමැති බැවින් පන්සිල් ආරක්ෂා කිරීමෙන් එම අවස්ථාව ගොඩ නැගෙන බව විස්තර විය යුතුය. එය සමාජ සහජීවනයට හේතුවන බවද විස්තර විය යුතුය. (ලකුණු 10යි)

(ii). බුදු දහම සෞන්දර්ය විරෝධී දහමක් නොවන බව නිදසුන් මගින් පැහැදිළි කරන්න.
සෞන්දර්ය රසාස්වාදනය බුදුදහම තුළ අවතක්සේරු කර නැති බව. ▪ බුදුරදුන් උසස් රස වින්දනය අගය කර ඇති බව. ▪ බුද්ධ ශ්‍රාවක - ශ්‍රාවිකාවන් භාවනාව මගින් ලැබූ කායික හා මානසික සැහැල්ලුව ද ඇති ව නිකෙලෙස් ඇසින් සුන්දරත්වය වින්දනය කොට ඇති බව. ▪ ස්වභාව සෞන්දර්යය හා නිර්මාණ සෞන්දර්යය ඇගයීමට ලක් කොට ඇති අවස්ථා මූලික සූත්‍රවල පවා බහුල ව දැකිය හැකි බව. විස්තර විය යුතුය (ලකුණු 10යි)

8. (i). පරිසර සංරක්‍ෂණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් වත්මන් පාරිසරික ගැටලු අවම කර ගැනීමට උපකාරීවන අයුරු පැහැදිළි කරන්න.
පරිසර සංරක්ෂණය සඳහා අදාළ කරගත හැකි අගනා උපදෙස් රැසක් බුදුසමයෙහි ඇතුළත් බව. ▪ බුදු රජාණන් වහන්සේ මෙන් ම ශ්‍රාවක භික්ෂූන් ද පිවිතුරු සුන්දර පරිසරයට ඇලුම් කළ බව හා සමීප වූ බව. ▪ සංයුක්ත නිකායේ වනරෝප සූත්‍රයේ වෘක්ෂලතා හා පරිසරය සංරක්ෂණයට අදාළ ඉගැන්වීම් ඉදිරිපත් කොට ඇති බව. විනය ශික්ෂාවන්හි මෙන් ම සේඛියාවල ද පරිසර සංරක්ෂණයට අදාළ කරුණු ඇතුළත් වන බව. ▪ ගස්වැල් සිඳීම, සියලු ආකාරයේ පැළ වන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්ති ලෙස දක්වා ඇති බව. ▪ වර්තමාන මිනිසාගේ ඇතැම් ක්‍රියාකාරකම් පරිසරයට අහිතකර ලෙස බලපා ඇති බව සහ එය මිනිසා සහිත සත්ත්ව හා ශාක ප්‍රජාවේ යහපැවැත්මට තර්ජනයක් වී ඇති බව. ▪ ජලයට මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම භික්ෂූන්ට තහනම් කොට ඇති බව. ▪ නිල් තණ පිට්ටනිවල මුත්‍රා කිරීම , මලපහ කිරීම, කෙළ ගැසීම භික්ෂූන්ට තහනම් කොට ඇති බව. මේවා ආදර්ශයට ගෙන වත්මන් සමාජය කටයුතු කරන්නේම් අවධිමත් සංවර්ධනය ද ඇතුළුව විවිධ සාධක පදනම්ව ගැටළු රැසක් නිර්මාණය වී ඇති අතර මාරාන්තික රෝගාබාධ ඇතිවීමත් ඕසෝන් ස්ථරයට හානි පැමිනවීම නිසා පරිසර උෂ්ණත්වය වැඩිවීම තවත් බොහෝ ගැටළු ඇතිවීමට හේතු වී ඇත. (ලකුණු 10යි)

(ii). පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න

(1) ආපද් ධර්ම
ආපදා අවස්ථාවක දී බ්‍රාහ්මණයාට ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණවලට අයත් කටයුතුවල නිරත විය හැකි බව. ▪ සෙසු වර්ණවල ජනයාට පහළ ශ්‍රේණිවලට අයත් කටයුතු කිරීමට හැකි වන අතර ශුද්‍රයනට අයත් කාර්යයන් කිසි සේත් ම වෙනස් නොවන බව. ▪ පහළ වර්ණවල ජනයාට, ඉහළ වර්ණවල ජනයාගේ කටයුතු කිරීමට නොහැකි බව.

(2) අටසිල්
පංචශීලයෙහි දැක්වෙන තුන්වෙනි සික්ෂාපදය වෙනුවට අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි, වලට අමතර ව තවත් ශික්ෂාපද තුනක් ආරක්ෂා කළ යුතු වෙයි. එනම්,
1. උස් ආසනවල හා මහ ආසනවල හිඳගැනීම ආදී ඉරියව් පැවැත්වීමෙන් වෙන්වීම.
2. නැටුම්, ගැයුම්, වැයුම්, උසුළු විසුළු, දර්ශනවලින් හා මල්මාලා, සුවඳවිලවුන් අලංකාර සැරසීම් ආදියෙන් වෙන්වීම.
3. අවේලාවෙහි ආහාර ගැනීමෙන් වලැකීම
ඇතුලත් අට පාලියෙන් හෝ සිංහලෙන් සටහන් කර තිබිය යුතුය

(3) සුභරතාව
පහසුවෙන් පෝෂණය කළ හැකි ය යන්න සුභරතාවෙන් අර්ථ ගැන්වෙන බව. ▪ භික්ෂු ජීවිතය මගින් එම ආදර්ශය ලැබෙන බව. ▪ ශිෂ්‍ය ජීවිතය ද සුභරතාවෙන් යුක්ත විය යුතු බව. ▪ සුභරතාව නිසා තමාට මෙන් ම අනුන්ට ද යහපතක් වන බව.

(4) භෝග සුඛය
උට්ඨාන වීර්යෙන් බාහු බලයෙන් ධාර්මිනව උපයාගත් පරිභෝජනය කිරීමෙන් ලබන ෂතුට භෝග සුඛය ලෙෂ හඳින්වේ. එම පරිභෝකනය පත්තකම්ම සූත්‍රයේ සඳහන් පරිදි සාමූහික පරිබෝජනයක් විය යුතුබව විස්තර වියයුතුය.
(ලකුණු 10යි)

---